2020.03.10. ලංකාදීප වාරිජ ලොබ සඳුව 04.

ආර්ථික අර්බුදයට මැතිවරණය විසඳුමක්ද?



ආර්ථිකයේ සෑම අංශයක්ම අර්බුදයකට ලක්වෙමින් පවත්නා තත්ත්වයක් තුළ යළිත් මහ මැතිවරණයක් පැවැත්වීමට සැරසෙයි. ලක්ෂ 69ක ජ්ඤ සංඛ්‍යාවක් ලබා රටේ ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීමට නව විධායක ජනාධිපති ලෙස තෝරාගත් රාජපක්ෂ මහතා රටේ ජනතාව පරාජය කරන්නේ දින 100ක් ගතවී නියැදුත් වනුම අපේක්ෂා කළ ප්‍රබල කාර්යක්ෂව ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. පාර්ලිමේන්තුවේ වැඩ බලයක් නොමැතිකම ඊට හේතුව බව පැවසිනි. ඒ නිසා ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් තමාට ලබාගැනීමේ අරමුණින් මෙම මැතිවරණය පැවැත්වෙන බවද පැවසේ.

කෙසේ වෙතත් 2/3ක පාර්ලිමේන්තු බලයක් ලබා ගත්තත් රට දියුණු කිරීමේ දැඩි අභියෝගයක් ආර්ථිකය පැත්තෙන් මතුව තිබේ. එය ආර්ථිකයේ සෑම අංශයකින්ම දිස්වේ. ඒ පිළිබඳව විමසීම මෙම ලිපියේ අරමුණයි.

මූලික්ම රටේ මූර්ත අංශය (Real Sector) පරීක්ෂා කර බලමු. 2005 සිට 2014 දක්වා බලයේ සිටි මහින්ද රාජපක්ෂ ජනපතිවරයාගේ කාලයේ මූල් වසර 5 තුළ (2005-2009) ආර්ථිකයේ මූර්ත අංශයේ දියුණුව මනිනු ලබන මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 6ක් බවට පත් කළා පමණක් නොව රටට සාපයක්ව තිබූ දැවැන්ත යුද්ධයක් කරා ගමන් ගත් වසර 30ක ජනවාර්ගික අර්බුදයට නීත තබමින් රටට සාමය ගෙන ඒමට එතුමාගේ නායකත්වය යටතේ රාජ්‍ය ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ විත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමත්විය. ඒ නිසාම රටේ මූර්ත අංශය 2010දී සියයට 8ක්, 2011දී සියයට 8.4ක් හා 2012දී සියයට 9.1ක් ලෙස නිදහසින් පසු පිට පිට වසර 3ක් සියයට 8කට වැඩි වර්ධනයක් හා 2010 - 2014 දක්වා පස් වසරක කාලය තුළ සියයට 6.8ක සාමාන්‍ය වර්ධනයක් ළඟා කර ගත්තේය.

එහෙත් එම පාලනය නිමාවට පත්කර බලයට පැමිණි යහපාලන ආණ්ඩුවේ නායක දෙපල (මෛත්‍රීපාල සිරිසේන - රනිල් වික්‍රමසිංහ) යටතේ රටේ මූර්ත අංශය වාර්ෂිකව දැවැන්ත පරිහානියකට ලක්වූ ආකාරය නිදහසින් පසු කිසිදු පස්වසරක කාලය තුළ අප දුටුවේ නැත. 2015දී සියයට 5ක්, 2016දී සියයට 4.5ක්, 2017දී සියයට 3.4ක්, 2018දී සියයට 3.2ක් හා 2019දී සියයට 2.6ක් ලෙස අඩුණ්ඩව මූර්ත අංශය ප්‍රපාතයකට තල්ලු වූ අතර 2015-2019 පස් වසරක කාලය තුළ ආර්ථිකයේ සාමාන්‍ය වර්ධනය සියයට 3.2ක් තරම් අඩු මට්ටමකට පත් කළේය. එපමණක් නොව යළි ආර්ථිකය ගොඩ ගැනීම අසීරුවන ආකාරයට 2019 පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරයක් රටට එල්ලවීමට හැකි වන ආකාරයට රටේ ආරක්ෂාවද දුර්වල වී තිබුණි. ඒ නිසාම ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ "රට නගන සෞභාග්‍යය දැක්ම" අපේක්ෂිත 2020 - 2025 කාලයේ සියයට 6.5ක සාමාන්‍ය වර්ධනය ළඟා කර ගැනීමටද අභියෝග එල්ල විය. දැනට වාර්තා වන ආකාරයට 2020 වර්ෂයේ වර්ධන වේගය සියයට 4ක් මට්ටමකටවත් ගෙන ඒමට හැකිද යන්න ගැටලුවක් වනුයේ කොරෝනා වසංගතය, හඬපට ගැටලුව, මහ මැතිවරණයක් පැවැත්වීමට යෑම යන කරුණු නිසාය.

පූර්ණ ආර්ථික විශ්ලේෂක
වින්සන්ත් මර්වින් ප්‍රනාන්දු

වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන ප්‍රබල ගැටලුව රාජ්‍ය මූල්‍ය අර්බුදයයි. 2005දී දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16.8ක් වූ රාජ්‍ය ආදායම 2019 අග වන විට සියයට 13ක මට්ටමකට අඩු වී තිබීයදීත් සංකීර්ණ බදු ක්‍රමය සරල කොට වැටුණු ආර්ථිකයට පුනර්ජීවනයක් ලබාදීමට සෞභාග්‍යයේ දැක්ම යටතේ නව ජනපති බදු බර අඩු කළත් රජයේ අපේක්ෂාව එමඟින් ඉටු කර ගන්නට ලැබුණේ නැත. බදු අඩු කිරීමෙන් ආර්ථිකයේ මූර්ත අංශය වර්ධනය වී බදු සංශෝධන නිසා අහිමි වූ ආදායමේ අවාසිය අවම වේයැයි රජය කල්පනා කළත් අවසානයේ සිදුවූයේ ආර්ථිකය වර්ධනය වීම කෙසේ වෙතත් රජයට රුපියල් බිලියන 400ක් අහිමි වීමට අවස්ථාවක් උදාවීමය. ඒ හරහා කුඩා වෙළෙඳුන් නම් තම ලාභය තර කර ගත්තේය. ඒ නිසාම ඉදිරියේදී රජයේ අයවැය හිඟය තව තවත් වැඩි වීමට ඉඩ තිබේ.

රාජ්‍ය ණය 2005 දී මහින්ද රාජපක්ෂ මහතා බලයට එනවිට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 91ක් තරම් ඉහළ මට්ටමක තිබුණි. විශාල වශයෙන් රජය ණය ගෙන දැවැන්ත පොදු කාර්යය පහසුකම් රැසක් නිමකොට (වරායක්, ගුවන් තොටුපොළක්, අධිවේගී මාර්ග දෙකක්) රාජ්‍ය ණය 2014 අග වනවිට සියයට 71කට අඩුකර ගත්තේය.

එහෙත් යහපාලන රජය දැවැන්ත බැඳුම්කර හොරකමකටද සම්බන්ධ වී සැලකිය යුතු පොදු කාර්යය පහසුකම් ඇති නොකොට අනවශ්‍ය වියදම් රැසක් කරමින් රාජ්‍ය ණය 2019 අග වනවිට යළිත් සියයට 91ක මට්ටමකට ඉහළ නැංවීය. මේ නිසා නව රජයද දැඩි රාජ්‍ය මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබෙන අතර සංවර්ධන ව්‍යාපෘතිවලට දයක වූ විවිධ කොන්ත්‍රාත්කරුවන්ගේ හිඟ මුදල් ගෙවීම, පොහොර සම්ාගමවල හිඟ මුදල් ගෙවීම ඇතුළු හිඟ වියදම් ගෙවීමට රුපියල් කෝටි 36700ක අමතර මුදලක් ලබාගැනීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවක්ද ආණ්ඩුව විසින්ම ඉවත්කර ගත්තේය. මේ වනවිට මහා භාණ්ඩාගාරය දුරුණු මූල්‍ය අර්බුදයකට මුහුණ පා සිටී. එයට විසඳුම් ඉදිරිපත් කිරීමට පවුත්න තත්ත්වය යටතේ නොහැකි නිසා අයවැයක් ඉදිරිපත් කොට වැඩි ඡන්දයෙන් සම්මත කර ගැනීමට ද නොහැකි නිසා රජයට මැතිවරණයකට යෑමට සිදුවී ඇත. මැතිවරණය ජයග්‍රහණය කොට අයවැයක් ඉදිරිපත් කොට රාජ්‍ය මූල්‍ය ගැටලු විසඳීමට හැකියයි රජය කල්පනා කරනවා විය හැකිය. මේ වනවිට චීනය, ශ්‍රී ලංකාවට ණය පහසුකමක් ලබාදීමට තීරණය කිරීමද රජයට තරමක අස්වැසිල්ලකි.

පාස්කු ප්‍රහාරයෙන් බිඳවැටුණු ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය, කොරෝනා වසංගතය නිසා දරුණු විය. ඒ නිසාම රටේ විදේශ අංශයද දැඩි පසුබැස්මකට ලක්වෙමින් පවතී. විදේශ රැකියාවල නියැලෙන පිරිස් වෙතින් ලැබුණු විදේශ ප්‍රේෂණ ආදායම අඩුවෙමින් පවතී. ණය වර්ගීකරණ ආයතන රටේ ණය වර්ගීකරණය අඩු මට්ටමකට පත්කර තිබෙන නිසා විදේශ ආයෝජන ලබාගැනීම හා විදේශ ණය ලබාගැනීම හා ගත් විදේශ ණය නිසි ලෙස නේරුම් කිරීමේ ගැටලුවටද රට මුහුණ දී සිටී.

රටේ මූල්‍ය අංශයද ප්‍රශ්න ගණනාවකට මුහුණදී සිටී. මූල්‍ය සම්ාගම් කිහිපයක් වැසියන තත්ත්වයකට පත්වීම එයින් එකකි. මේ වනවිට උද්ධමනයද සියයට 6ක මට්ටම ඉක්මවා යමින් තිබේ. එහෙත් මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යක්මතාව ඊත 2020 ''නම්‍යශීලී උද්ධමනය ඉලක්කකරණය'' වූ 4% - 6%ක මට්ටම රඳවා ගනු ඇත. මේ වනවිට රට සෑම අංශයකින්ම දරුණු ආර්ථික අර්බුදයකට ගමන් කරමින් සිටින තත්ත්වයක් තුළ යළි මහ මැතිවරණයක් කරා ගමන් කරමින් අර්බුදයට පිළියම් සෙවීමට තැත් කළත් එයින් කොතෙක් දුරට දැනට තිබෙන ආර්ථික අර්බුදවලට විසඳුම් සොයා ගත හැකි පාලනයක් බිහිවේද? යන්න ගැටලුවක් බව අවසාන වශයෙන් මතක්කර දීමට කැමැත්තෙමි.